# ලංසු කැඳවීම

## සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

## ජාතික තරඟකාරී ලංසු කැඳවීම යටතේ ක්ෂය රෝග මර්දන හා ළය රෝග පිළිබඳ ජාතික වැඩසටහන සඳහා පිරිසිදු කිරීමේ සේවය සපයා ගැනීම / පිරිසිදු කිරීමේ සේවාවට අදාළ රසායන ද්‍රව්‍යය සපයා ගැනීම

ක්ෂය රෝග මර්දන හා ළය රෝග පිළිබඳ ජාතික වැඩසටහනේ පහත සඳහන් සේවාවන් සහ ද්‍රව්‍යයන් මිලදී ගැනීම සඳහා සුදුසු කොන්ත්‍රාත්කරුවකු / කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීම වෙනුවෙන් මිල ගණන් කැඳවනු ලැබේ.

1. 2026-2029 වර්ෂ 03ක් සඳහා පිරිසිදු කිරීමේ සේවය සැපයීම.
2. 2026-2027 වර්ෂය සඳහා පිරිසිදු කිරීමේ සේවය සැපයීමට අදාළව රසායනික ද්‍රව්‍යය සැපයීම.

- ❖ ලංසු අයදුම්පත් 2026-04-06 දින සිට 2026-04-20 දින දක්වා සතියේ වැඩ කරන දිනයන්හි පෙ.ව. 9.00 සිට ප.ව. 2.00 දක්වා ක්ෂය රෝග මර්දන හා ළය රෝග පිළිබඳ ජාතික වැඩසටහන, මහජන සෞඛ්‍ය සංකීර්ණය, අංක 555/5, ඇල්විටිගල මාවත, කොළඹ 05 ගිණුම් අංශයෙන් ලබා ගත හැකිය. ලංසු අයදුම්පත්‍ර ලබා ගැනීම සඳහා ආපසු නොගෙවනු ලබන රු. 3,500.00ක ගාස්තුවක් ක්ෂය රෝග මර්දන හා ළය රෝග පිළිබඳ ජාතික වැඩසටහන සරප් අංශය වෙත මුදලින් ගෙවා ලබාගත් ලදුපත හා ලංසු ලියවිලි ඉල්ලුම් කිරීමේ ලිපිය ඉදිරිපත් කළ යුතුය.
- ❖ සම්පූර්ණ කරන ලද ලංසු ලියවිලි 2026-04-21 දින පෙ.ව. 10.00ට පෙර ලැබෙන සේ **සභාපති, ක්ෂය රෝග මර්දන හා ළය රෝග පිළිබඳ ජාතික වැඩසටහන, මහජන සෞඛ්‍ය සංකීර්ණය, අංක 555/5, ඇල්විටිගල මාවත කොළඹ 05** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ කාර්යාලයේ තබා ඇති ලංසු පෙට්ටියට බහාලීම හෝ භාරදීමට කටයුතු කළ යුතුය. ලංසු බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"2026/2029 වර්ෂ 03ක් සඳහා පිරිසිදු කිරීමේ සේවාව සැපයීම/ 2026-2027 වර්ෂය සඳහා පිරිසිදු කිරීමේ සේවය සැපයීමට අදාළව රසායනික ද්‍රව්‍යය සැපයීම"** යනුවෙන් සඳහන් කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- ❖ ලංසු ලියවිලි පිටපත් 02කින් මුල් පිටපත හා අනු පිටපත යනුවෙන් සඳහන් කර වෙන වෙනම කවරවල බහා එම කවර දෙක තනි කවරයක බහා ඉදිරිපත් කළ යුතුය.
- ❖ **2026-04-21 දින පෙ.ව. 10.00** දක්වා ක්ෂය රෝග මර්දන හා ළය රෝග පිළිබඳ ජාතික වැඩසටහන් කාර්යාලයේ දී ලංසු භාරගැනීම සිදු කෙරේ. ලංසු භාරගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරන අතර, ලංසුකරු හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට ලංසු ලියවිලි විවෘත කිරීමේ අවස්ථාවට සහභාගී විය හැකිය. වැඩි විස්තර සඳහා ගණකාධිකාරී / පරිපාලන නිලධාරී අමතන්න. (දුරකථන අංක 011-2368274, 011-2368275) **https://www.nptccd.health.gov.lk** දරන වෙබ් අඩවියට පිවිසීමෙන් ඔබට අවශ්‍ය තොරතුරු ලබාගත හැක.
- ❖ පූර්ව ලංසු රැස්වීම **2026-04-09 දින පෙ.ව 10.00** ක්ෂය රෝග මර්දන හා ළය රෝග පිළිබඳ ජාතික වැඩසටහන් කාර්යාලයේ දී පැවැත්වේ
- ❖ ඉදිරිපත් වන ලංසු පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ප්‍රසම්පාදන කමිටුව සතු වන අතර, ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසාන තීරණය වේ.

**සභාපති,**
**ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව**
**ක්ෂය රෝග මර්දන හා ළය රෝග පිළිබඳ ජාතික වැඩසටහන,**
**මහජන සෞඛ්‍ය සංකීර්ණය ,**
**අංක 555/5, ඇල්විටිගල මාවත, කොළඹ 05.**